## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව.

## කොළඹ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 10 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුලි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 31 දින ද සභාවට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) 2016 නොවැම්බර් මස 03 වන දින පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුනු වටිනාකම රු.80,085,000 ක් වූ වාහන 14 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. | සභාව සතු සියළු වත්කම් ගිණුම්ගත කල යුතුවේ. | කොළඹ අග නගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සභාව වෙත ලබා දුන් වාහන 14 සභාව වෙත පවරා දී නොමැති බැවින්මෙම වාහන පවරා ගෙන 2019 වර්ෂය සඳහා අවසන් ගිණුම් සැකසීමේ දී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) රු.181,493,058 ක්වූ ස්ථාවර තැන්පත් ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | ද්‍රවශීලතා පදනම මත ශේෂ පත්‍රයේ වත්කම් පෙලගැස්විය යුතුවේ. | විගණනය විසින් පෙන්වා ඇති පරිදි 2019 වර්ෂය සඳහා ගිණුම් සැකසීමේ දී නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරමි. |
| (iii) 2017 වර්ෂයේ මිලදීගත් රු.5,700,000 ක් වූ ඉසුසු කෲ කැබ් රථය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් පවරාගෙන ප්‍රාග්ධනිත කළ යුතු වේ. | WP PI – 0511 දරණ ඉසුසු කෲ කැබ් රථයද මේ වන තෙක් මෙම සභාව වෙත පවරා දී නොමැති අතර පවරා ගැනීමට කටයුතු කර 2019 අවසන් ගිණුම් සැකසීමේ දී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. |
| (iv) 2008 - 2012 අතර කාලයේ සභාව විසින් අත්පත් කරගත් රු.405,000 ක් වටිනා ට්‍රේලර් 03ක් හා වටිනාකම රු.900,000 ක් වූ ට්‍රැක්ටරයක් ප්‍රාග්ධනිත | සියලු වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ට්‍රේලර් 3 හා ට්‍රැක්ටරය 2019 වර්ෂයේ ජ' නල් අංක 02 යටතේ ගිණුම් ගත කරන බව දන්වා සිටිමි. |

කර නොතිබුණි.

| | | |
|---|---|---|
| (v) විමධ්‍යගත අරමුදලින් සභාවේ සෘජු ශ්‍රම පදනම යටතේ 2018 වර්ෂය තුල ඉටු කරන ලද කර්මාන්ත 16කට අදාලව රු.3,354,848 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | වර්ෂයට අදාල ගෙවිය යුතු වියදම් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසාගත යුතුවේ. | ණයහිමි ප්‍රතිපාදන වෙන් කිරීම නිසා සිදුවූ වරද 2019 අවසන් ගිණුම් සැකසීමේදී ගැලපීමට කටයුතු කරමි. |
| (vi) ගිවිසුම් කොන්දේසි කඩකිරීම හේතුවෙන් ජනජයසිටි ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු පොලී ගාස්තුව හා අතිරේක පිරිවැය රු.130,736,933 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | කොන්ත්‍රත්කරුට ගෙවීම් ප්‍රමාද කිරීම මත ගෙවිය යුතු රු. 130,736,933 ක මුදල ගෙවීම උපදේශන සේවා ආයතනය විසින් නිර්දේශ කර නොමැති බැවින් හෙළිදරව් කිරීමට කටයුතු නොකළෙමි. |
| (vii) ජයරජ සිටි වෙළඳ සංකීර්ණයේ කඩකාමර පෙර විකුණුම් පදනම මත ආයෝජකයන්ගෙන් අයකර ගෙන තිබුණු රු.158,178,354 ක මුදල ජයරජ සිටි සංකීර්ණය ඉදිකිරීම නතරවීම හේතුවෙන් බාහිර පාර්ශවයකට ගෙවිය යුතු වගකීමක් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි. | වගකීමක් ලෙස ගිණුම් වල දැක්විය යුතුවේ. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා ඇතත් දැනට ඇති වී ඇති ගැටළුකාරී තත්ත්වය නිරාකරණය කිරීමෙන් අනතුරුව ඉදිකිරීම් කටයුතු යලි ආරම්භ කිරීමට සභාව කටයුතු කරමින් පවතී. එම නිසා මෙය බාහිර පාර්ශවයකට ගෙවිය යුතු වගකීමක් ලෙස සලකා ගිණුම්වල දක්වා නොතිබුණි. |

(ආ) නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූලා‍ ප්‍රකාශන වල දැක්වෙන සේවක ණය ශේෂය හා උපලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු.1,786,634ක වෙනසක් විය. | ශේෂ සංසන්දනය කර නිවැරදි කිරීමට පියවර ගත යුතුවේ. | මෙම වෙනස 2010 වර්ෂයන්ට පෙර සිට පැවත එන්නකි. බොහෝ පැරණි ණය ලේඛන සහ අදාල තොරතුරු විනාශ වී ඇති අතර හැකිතාක් ලේඛන සංසංදනය කොට මෙම හඳුනා නොගත් ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සිනමා ශාලා 02 කින් ලැබිය යුතුව තිබූ රු.2,781,680 ක් වූ විනෝද බදු වටිනාකම වසර ගණනාවක සිට නිරවුල්කර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට හෝ අදාල අනුමැතිය මත ගිණුම් වලින් ඉවත්කිරීමට පියවර ගත යුතුවේ. | විනෝද බදු ප්‍රතිපූර්ණය කිරීම රජය මඟින් සිදු නොකරන බව භාණ්ඩාගාරයෙන් දැනුම් දී ඇති බව පළාත් පාලන කොමසාරිස්තුමා විසින් දන්වන ලදී. ඒ අනුව ප්‍රතිපූර්ණය නොකරන ලද රු.2,781,679 ක් කපා හැරීමට කටයුතු කරන ලෙස දන්වා පළාත් පාලන කොමසාරිස්තුමිය වෙත යවා ඇත. |

| | | |
|---|---|---|
| (ii) 2017 වර්ෂයට අදාලව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතුව තිබූ සේවක ණය පොලි රු.254,402ක් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | සේවක ණය පොලී ප්‍රතිපූර්ණය කරගත යුතුවේ. | 2017 වර්ෂයට අදාලව ලැබිය යුතුව තිබූ දේපල ණය පොළී රු.255,248ක මුදල ප්‍රතිපූර්ණය කිරීමට නොහැකි බව පළාත් පාලන දෙපාර්තමේන්තුව දන්වා ඇත. |
| (iii) බාහිර පාර්ශවයක් වෙත නිකුත්කර තිබූ "අසිරිමත් කෝට්ටේ" ග්‍රන්ථ 30ක් වෙනුවෙන් අයවිය යුතු රු.51,000 ක් අයකරගෙන නොතිබුණි. | අදාල මුදල් හෝ ග්‍රන්ථ නොපමාව සභාව වෙත ලබාගත යුතුවේ. | රජයේ මුද්‍රණාලයෙන් නිකුත් කර ඇත්තේ අසිරිමත් කෝට්ටේ ග්‍රන්ථයෙහි පිටපත් 3921 ක් පමණි. ඉන් අප සභාව වෙත ලබාගෙන ඇත්තේ ග්‍රන්ථ 3891 කි. ඉතිරි ග්‍රන්ථ 30 ග්‍රන්ථ සංස්කාරක ආචාර්ය ධර්මරත්න හේරත් මහතා විසින් ලබාගෙන ඇති අතර ඒ වෙනුවෙන් සභාවට ලැබිය යුතු මුදල් ගෙවන ලෙස හෝ ආපසු සභාව වෙත භාර දෙන ලෙස දන්වා ඇත. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු ඉදිරිපත් නොකිරීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු. 461,701,101ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාලව විස්තරාත්මක උපලේඛන සහ ගෙවීම් සනාථ කරන තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සංනිරීක්ෂණය / සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | අදාල තොරතුරු සොයාබලා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | වරිපනම් බදු අයකිරීම සඳහා සභා බලප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වර්ෂ 05 කට වරක් තක්සේරුකර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | 2019.07.02 දින ගරු නගරාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡාවක් පැවැත් වූ අතර එහිදී ඔවුන් 2019 අගෝස්තු මස සිට නව තක්සේරුව ආරම්භ කිරීමට කටයුතු කරන බැව් ප්‍රකාශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. මු.රෙ 371(5) | සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 04 දෙනෙකුට දෙනලද රු.400,064ක අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | මෙම අත්තිකාරම් මුදල් හැකි ඉක්මණින් පියවා ගැනීම සඳහා ලිඛිතව දැනුවත් කිරීම් කරනු ලබයි. |
| ii. මු.රෙ 571 | වර්ෂ 07 ක සිට පැවත එන රු.676,800 වන තැන්පතු ශේෂ සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | 1997 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ලබා නොගත් තැන්පත් මේ වනවිට සභා ආදායමට බැර කර ඇත. 2012 වර්ෂයේ සිට 2016 දක්වා වූ වර්ෂ 5 ක මේ දක්වා ලබා නොගත් තැන්පත් ශේෂයන් තවදුරටත් අවශ්‍ය නොවේ යැයි තහවුරු කොට ගෙන මහා සභා අනුමැතියට ඉදිරිපත් කර සභා ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |
| iii. මු.රෙ 1642 | 2018 වර්ෂය තුලදී සිදුවී ඇති වාහන අනතුරු 13ක් සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | පිළිතුරු ලබා දී නැත. |
| (ඇ) වෙනත් චක්‍රලේඛ | | | |
| 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන පළාත් පාලන චක්‍රලේඛය | කඩකුලී තක්සේරුව වසර 3කට වරක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | තක්සේරු දෙපාර්තුමේන්තුව විසින් නාගරික කොමසාරිස් වෙත යොමු කරන ලද CM/KMC/විවිධ/2019 හා 2019.06.26 හා දිනැති ලිපියට අනුව තක්සේරුව සඳහා අවශ්‍ය වාර්තා තක්සේරු දෙපාර්තුමේන්තු වෙත යැවීම සඳහා සකස් කරමින් පවතී. |

## 02 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.333,399,607ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු..248,629,914 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 222,000,000 | 237,433,234 | 211,577,509 | 101,507,737 | 212,000,000 | 238,345,909 | 243,444,275 | 87,657,889 |
| (ii) කුලී | 65,053,000 | 29,562,074 | 29,302,712 | 5,522,091 | 57,609,000 | 29,283,412 | 29,618,519 | 4,541,197 |
| (iii)බලපත්‍ර ගාස්තු | 6,361,000 | 6,715,639 | 6,715,639 | - | 5,961,000 | 6,236,406 | 6,236,406 | - |
| (iv)වෙනත් ආදායම් | 379,542,000 | 468,558,207 | 466,230,979 | 3,425,777 | 368,458,000 | 334,748,201 | 334,461,957 | 1,074,055 |
| එකතුව | 672,956,000 | 742,269,154 | 713,826,839 | 110,455,605 | 644,028,000 | 608,613,928 | 613,761,157 | 93,273,141 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ වරිපනම් වටිනාකම රු.50,000 ක් ඉක්ම වූ නිවාස, හිස් ඉඩම් හා ව්‍යාපාර ස්ථාන 224 කින් රු.24,361,203 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ වරිපනම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | මෙම හිඟ වරිපනම් බදු ශේෂය අයකර ගැනීම සඳහා 2019 වර්ෂයේදී වරෙන්තු නිකුත් කිරීම , රතු නිවේදනය නිකුත් කිරීම, දේපල තහනම් කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම වැනි පියවර ගනිමි. |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සභාවට අයත් වෙළඳ සංකීර්ණ 3කින් හා නුගේගොඩ ජනතා පොලෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.1,463,411ක හිඟහිටි කුලියක් විය. | හිඟ කුලී අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | සභාවට අයත් වෙළඳ සංකීර්ණ වල 2018.12.31 දිනට හිඟ කඩ කුලියෙන් 2019.06.30 දක්වා රු.974,829 ක් අයකර ගෙන ඇත. |

2.3 අධිභාර

----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| මහා නගර සහා ආඥා පනතේ (252 වන අධිකාරය) 226 (1) වගන්තිය ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන්වල පැනවූ වටිනාකම රු.24,582,843ක් වූ අධිභාර 14කට 2018 දෙසැම්බර් 31දිනට මුදල් අයකර ගැනීමට තිබුණි. | සියළු අධිභාර සම්බන්ධයෙන් නොපමාව කටයුතු කළයුතුවේ. | මේ වන විට රු.549,000 ක්වූ අධිභාර දෙකකට මුදල් ගෙවා ඇති අතර රු.310,000 ක් වූ අධිභාරයක් සඳහා මුදල් ගෙවමින් පවතී. ඉතිරි අධිභාර සම්බන්ධ නෛතික ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කාර්යසාධනය

--------------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අත්හැර දැමූ කර්තව්‍යන්

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) 2014 වර්ෂය තුළදී ආරම්භකළ මහා නගර සභා වැඩ ඒකකය, වාහන නඩත්තු ඒකකය සහ ගබඩා සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.17,651,987ක් වැයකර තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන අතහැර දමා තිබුණි. | සැලසුම් කළ ව්‍යාපෘති අවසන් කරගැනිමට කටයුතු කලයුතුවේ. | ව්‍යාපෘතිය නතර කරන ලෙස මහජනතාව විසින් එල්ල කළ විරෝධතාවයන් හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩකටයුතු අත්හිටුවීමට සිදු විය. වර්තමානයේ එහි ක්‍රීඩාගාරයක් සෑදීමට කටයුතු යොදා ඇති අතර පෙර ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරුම නව ව්‍යාපෘතිය ඉටු කිරීමට එකඟ වී ඇත. ඒ අනුව ගෙවීම් කරන ලද රු.17,651,987 මුදලින් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට හැකිවන බව දන්වමි. |
| (ii) 2018 අයවැය ලේඛනය මගින් මහජන සුභ සාධක සේවා වෙනුවෙන් වූ කර්තව්‍යයන් 03ක් ඉටු කිරීම සඳහා රු.3,750,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද එකී සේවා මුළුමනින්ම ඉටුකර නොතිබුණි. | ප්‍රතිපාදන සලසා ගැනීමේදී අදාල වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පදනම් කර ගත යුතුවේ. | අයවැය ලේඛනය සැකසීමේ දී පසුගිය වර්ෂ මත පදනම්ව ප්‍රතිපාදන වෙන් කරන අතර අදාල මහජන සුභ සාධක සේවා වෙනුවෙන් ගෙවීම් සභා තීරණ මත, ඇතිවන ආපදා තත්ත්වයන් මත සිදු කරනු ලැබේ. ආගමික කටයුතු, සුභ සාධක ආධාර හා වැඩිහිටි සංවිධාන සඳහා ආධාර ලබා දීමේ දී ආගමික ස්ථාන වලින් හෝ වැඩිහිටි සංවිධානවල ඉල්ලීම් මත ආධාර මුදල් ලබා දීමට කටයුතු කරමි. |

(ආ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවාරි 04 දිනට සහ 2017 අගෝස්තු 15 දිනට වැඩ අවසන් කලයුතුව තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රුපියල් මිලියන 682 වූ ව්‍යාපෘති දෙකක් 2019 ජූනි 24 දින වන විට නිමකර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුගමනය කළ යුතුවේ. | මොරගස්මුල්ල හා අංගම්පිටිය නිවාස සංකීර්ණ දෙකෙහිම ඉදි කිරීම් කටයුතු සිදු කරන ලද්දේ Electro Metal Pressing (PVT) Ltd ආයතනයම බැවින් අංගම්පිටිය නිවාස සංකීර්ණයේ ඇති වූ ඉරි තැලීම් ආදිය හේතුවෙන් එම ආයතනය අසාධු ලේඛණගත කල බැවින් මොරගස්මුල්ල නිවාස සංකීර්ණයේ ද වැඩ නතර කරන ලදි. නගර සභාවෙහි සෘජු ශ්‍රමය යටතේ එම ව්‍යාපෘතියෙහි වැඩ අවසන් කිරීමට කටයුතු යොදා ඇත. ජයරජ සිටි ගොඩනැගිලි සැලැස්මේ ඇතිවූ ව්‍යුහාත්මක දෝෂ හේතුවෙන් ව්‍යාපෘතිය නතර කරන ලද නමුත් මෙම ව්‍යාපෘතියේ පැවති අඩුපාඩු මග හරවා ගනිමින් නව ව්‍යාපෘතියක් ලෙස දීර්ඝ කාලීන බදු පදමනම යටතේ එම කොන්ත්‍රාත් ආයතනය වෙත ලබා දීමට මහා සභා අනුමැතිය ලැබී ඇත. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) දකුණු කලාපයේ කසළ කළමනාකරණය<br><br>ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා බලප්‍රදේශයේ දකුණු කලාපයේ කසළ කළමනාකරණය වෙනුවෙන් 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව රු.94,354,293ක් පෞද්ගලික සමාගමකට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| ▪ කොන්ත්‍රාත්කරු සමග එළඹී ගිවිසුමට අනුව කොන්ත්‍රාත්කරු පිරිසිදු කළ යුතු මාර්ග 444ක් ඇතුලත් කර තිබූ නමුත් එය සභාව විසින් විගණනයට ඉදිරිපත් කර තිබුණු මාර්ග ලේඛණය හා නොසැසඳිනි . එකී මාර්ගවල භෞතිකව කරන ලද පරීක්ෂාවේදී එම ප්‍රදේශය භාර කොන්ත්‍රාත්කාර සමාගමේ සුපරීක්ෂකවරයාට හා සභාවේ සෞඛ්‍ය පරීක්ෂකවරයාට මාර්ග නිවැරදිව | නිවැරදි ලේඛනයක් සකසා ගෙන ගෙවීම් කිරිමට වග බලා ගත යුතුවේ. | මාර්ග ලේඛනය සැකසීමේදී නාගරික ඉංජිනේරු අංශයේ මාර්ග ලේඛණය උපයෝගි කරගෙන ඇත. ඒ අනුව අදාල ටෙන්ඩර් කටයුතු කිරීමේදී මහා මාර්ග, පළාත්බද මාර්ග, නගර සභා මාර්ග හා සමහර පුද්ගලික මාර්ග, මෑතකදී සභාවට පවරාගත් මාර්ග හා |

| | | |
|---|---|---|
| හඳුනාගත නොහැකි විය. එමෙන්ම කොන්ත්‍රාත්කරු විසින් දෛනිකව මාර්ග අතුගා පිරිසිදු කිරීම සඳහා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් යොදවා නොතිබුණු අතර, මාර්ග නිසි පරිදි අතුගා පිරිසිදු කර නොතිබුණි . | | අලුතින් සංවර්ධනය කරන ලද මාර්ග මෙම මාර්ග ලේඛණයේ ඇතුලත් වී නොමැත. සේවාවන් සපයා නැති මාර්ග පරීක්ෂා කර බලා ඒ අනුව ගාස්තු අඩු කර ගෙවීම් කරමි. |
| ▪ කොන්ත්‍රාත් ගිවිසුමේ අංක 31 වගන්තියට අනුව බලප්‍රදේශයේ කසළ එකතු කිරීම, මාර්ග අතුගෑම, දූවිලි පිසදැමීම හා වල්පැල ගැලවීම කොන්ත්‍රාත්කරු විසින් නිසිලෙස ඉටුකර තිබෙන බවට සභාවේ වගකිව යුතු නිලධාරියකුගේ වාර්තා ලබා ගෙන නොතිබුණි. | ගිවිසුම පරිදි කටයුතු කළයුතුවේ. | දකුණු කලාපයේ කසල කළමණාකරන කටයුතු අධීක්ෂණය සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා යොදවා ඇති අතර ඒ සම්බන්ධ වාර්තාවන් හා විධිමත් තහවුරු කර ගැනීම් ලබාගැනීමට ක්‍රමවේදයන් සකස්කිරීමට කටයුතු කරමි. |
| ▪ මහා නගර සභා ආඥා පනතේ 100 (1) ට අනුව සභාව විසින් ප්‍රදේශයේ කාණු පිරිසිදු කර නොතිබුණු අතර කාණු සම්බන්ධ සභාවට ලැබී ඇති මහජන පැමිණිලි වලින් 75% ට වඩා වැඩි ප්‍රමාණයක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මහා නගර සභා ආඥා පනත අනුව කටයුතු කලයුතුවේ. | පවතින සේවක හිගය හා මහජනතාව විසින් කරන අවිධිමත් බැහැර කිරීම් හැරුනුකොට නාගරික සෞඛ්‍ය ඒකකය සතු සේවකයින්ගේ ශ්‍රමය සහ හැකියාව උපරිම ලෙස පාවිච්චි කරමින් මෙම කටයුතු කාර්යක්ෂමව සිදු කරනු ලැබේ. |

(ii) උතුරු කලාපයේ කසළ කළමනාකරණය
-----------------------------------------------

සභාවේ උතුරු කලාපයේ කසළ කළමනාකරණ කටයුතු වෙනුවෙන් 2018 වර්ෂයේදී සේවක වැටුප් හා අතිකාල, වාහන අළුත් වැඩියා, ඉන්ධන සහ කසළ බැහැර කිරීමේ ගාස්තු වශයෙන් රු.97,984,639ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| | | |
|---|---|---|
| • බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2017 මැයි මස අංක LGD/03/2017 දරන චක්‍රලේඛය අනුව පළාත තුල ජනනය වන කසළ ප්‍රමාණයෙන් පළාත් පාලන ආයතන විසින් එකතු කරනු ලබන කසළ ප්‍රමාණය අවම කිරීම සඳහා එකතු කරනු ලබන සියළුම කසළ 100% ක් වෙන්කර භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කසල වෙන්කිරීමේ නිවැරදි ක්‍රමවේදයක් හඳුන්වා දී අනුගමනය කලයුතුවේ. | කසළ වෙන් කර නගර සභා රථයට ලබාදෙන ලෙස මහජනතාව දැනුවත් කර දැන්වීම් පත්‍රිකා මුද්‍රණය කර සභා බල ප්‍රදේශයේ නිවැසියන් වෙත ලබා දී ඇත. යම් අවස්ථාවලදී දිරන කසළ හා නොදිරන කසළ මිශ්‍ර වූ අවස්ථාවලදී සභාව මගින් එම අපද්‍රව්‍ය රැගෙන නොයෑමට සහා සේවකයින් දැනුවත් කර ඇත. වර්තමානයේ කසළ 100% වෙන්කර ලබාගැනීමට සේවකයින්ව දැනුවත් කර ඇත. |
| • තවද ඉහත චක්‍රලේඛය පරිදි පර්චස් 10 ට වැඩි භූමි ප්‍රමාණයකට හිමිකම් ඇති නිවෙස් හිමියන්ගේ දිරන කසළ කොම්පෝස්ට්කරණය සඳහා සභාව විසින් ලිඛිත | විධිමත් පසු විපරමක් ක්‍රියාවලියක් අනුගමනය | මහා නගර සභාවේ සෞඛ්‍ය අංශයේ සියළු සෞඛ්‍ය ගැටළු පරීක්ෂා කිරීම සඳහා එක් මහජන සෞඛ්‍ය |

| | | |
|---|---|---|
| අත්පත්‍රිකා මගින් දැනුවත් කරතිබුණද ඒ පිළිබඳ පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබුණි. | කලයුතුවේ. | පරීක්ෂකවරයෙක් පමණක් සිටින බැවින් ඔහුට සියළු ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් ඉටු කල නොහැකි තත්වයක් ඇති බැවින්, පසු විපරම් කිරීමට ඉඩ ලැබෙන අවස්ථාවලදී පරීක්ෂා කිරීම් කර බැහැරව යාම් ඇතොත් ඒ සඳහා අදාළ උපදෙස් ලබාදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| • එම චක්‍රලේඛයේ 08 වන ඡේදය පරිදි සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම මාසිකව කසළ පොලක් පැවැත්විය යුතු වුවද සභාව විසින් 2018 වර්ෂය සඳහා කසළ පොල පවත්වා තිබුණේ දෙවතාවක් පමණි. ඒ පිළිබඳ පළාත් පාලන සහකාර කොමසාරිස්ට හා ඝන අපද්‍රව්‍ය අධිකාරියටද යැවිය යුතු වාර්තා යවා නොතිබුණි. | කසළ පොල විධිමත් පරිදි පවත්වා ගතයුතුවේ. | 2018 වර්ෂයට දෙවතාවක් කසල පොල පැවැත්වීමට මහජනතාව දැනුවත් කලද, ඒවා ලබාගැනීම සඳහා කිසිම ගැණුම්කරුවෙකු නොපැමිණි බැවින්, ආදායමක් උපයා නොගත් අතර ඒ සම්බන්ධ වාර්තා යැවීමක් ද සිදු වී නැත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ සභාව දැනුවත් වී තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණි. | 2030 න්‍යාය පත්‍රයට අනුව ක්‍රියාත්මක විය යුතු වේ. | මෙම වැඩමුළුව සඳහා මහා නගර සහා නිලධාරීන් සහභාගී වී ඇති අතර 2030 තිරසර සැලැස්ම කෙටුම්පත් කිරීම සිදු කර ඇත. එය මහා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර අනුමත වූ පසු ක්‍රියාත්මක කිරීම සිදු කරන බව දන්වා සිටිමු. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ගිනි නිවීම් සේවා සඳහා කඩුවෙල, කොටිකාවත්ත, හෝමාගම, සීතාවකපුර, සීතාවක පළාත් පාලන ආයතන සමඟ ගිවිසුම් ගත නොවීම නිසා 2018 වර්ෂය සඳහා රු.1,125,000 ආදායමක් අහිමි වී තිබුණි. | ගිවිසුම් ගතවීමට අවශ්‍ය පියවර කඩිනම් කලයුතුවේ. | ගිනි නිවීමේ සේවා සහාය ලබා දීම පිණිස ගිවිසුම්ගත වීම සඳහා එම පළාත් පාලන ආයතන වෙත 2018.09.21 දාතමින් යුතුව සිය එකඟතාවයන් දැනුම් දෙන ලෙස සඳහන් කරමින් ලිඛිත දැනුම් දීම් සිදුකර ඇත. නමුත් ගිවිසුම් ගත වීම සිදු වී නොමැත. |
| (ආ) ස්ථාවර කමිටු යෝජනාවකට අනුව සේවයේ නියුතු නිලධාරීන් 75 දෙනෙකුට රාජකාරි කටයුතු සඳහා සභාවෙන් ලබා දී තිබුණු මොබිටෙල් සම්බන්ධතාවය සහිත ජංගම දුරකථන 75 ක් වෙනුවෙන් දුරකථන ගාස්තු ලෙස ගෙවා තිබුණු රු.223,623ක් | රජයේ නිලධාරින්ට දුරකථන ලබාදීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති නීතිරීති රෙගුලාසිවලට | මෙම දුරකථන සබඳතාවයන් සඳහා සභාව විසින් ගෙවනු ලබන්නේ එක් අයෙකු සඳහා උපරිමය රු.500 ක් වන මාසික ගාස්තුවක් පමණි. ඊට අමතරව වැඩිවන ගාස්තුව දුරකථනය භාවිතා කරන්නාගේ වැටුපෙන් අය කරනු ලබයි. |

| | | |
|---|---|---|
| අදාල නිලධාරීන්ගෙන්/සේවකයන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | අනුකූල විය යුතුවේ. | |
| (ඇ) 2015 වර්ෂයේදී රු.2,825,375 ක් වැයකර මුද්‍රණය කරන ලද " අසිරිමත් කෝට්ටේ'' නැමති ග්‍රන්ථයේ පිටපත් 4000 කින් 2019 අප්‍රේල් 23 දිනට ග්‍රන්ථ 3119 ක් හා රු.65,325ක් වටිනා එම ග්‍රන්ථයේ කවර 875ක් ගබඩාවේ ඉතිරිවී තිබීම නිසා ග්‍රන්ථය මුද්‍රණය කිරීමේ පරමාර්ථය ලෙස සභාව විසින් දක්වා තිබූ ''කෝට්ටේ ඓතිහාසික ශ්‍රී විභූතිය රට පුරා පාසැල්, විශ්ව විද්‍යාල සිසුන් මෙන්ම මුළු මහත් පාඨක ජනතාව අතරට ගෙන ගොස් කෝට්ටේ ඓතිහාසික අභිමානය නැවත සිහියට නැගීම සඳහා'' යන මුඛ්‍යය පරමාර්ථය ඉටු වී නොතිබුණි. | ග්‍රන්ථය පරිහරණය කිරීමට ඉඩ සැලැස්විය යුතුවේ. | ගබඩාවේ ඉතිරිව ඇති, ''අසිරිමත් කෝට්ටේ''ග්‍රන්ථය අධ්‍යාපන අමාත්‍යාංශ යටතේ පවතින පාසැල් පුස්තකාල සඳහා ලබාදීමට සභාව විසින් තීරණය කර ඇත. |
| (ඈ) ප්‍රවර්තන වර්ෂයේදී සභා අරමුදලින් සෘජු ශ්‍රම පදනම මත ඉටු කරන ලද කර්මාන්ත වෙනුවෙන් ලිපිගොනු නඩත්තුකර නොතිබූ අතර වැඩ අධිකාරී හා අදාල කර්මාන්තය භාර තාක්ෂණ නිලධාරීගේ ඇස්තමේන්තුව පදනම් කරගෙන අත්තිකාරම් මුදල් ලබාගනිමින් එකී නිළධාරීන්ගේ අභිමතය පරිදි අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගෙන කර්මාන්ත ඉටුකර තිබුණි. දෙන ලද අත්තිකාරම් මුදල ඉක්ම වූ වියදම සඳහා නිලධාරීන් විසින් අතින් දැරූ වියදම් ලෙස විශාල මුදලක් සභාවෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබූ අතර, මෙහිදී සභාවේ සැපයුම් අංශය හා ප්‍රධාන ගබඩාව හරහා භාණ්ඩ මිල දී නොගැනීම නිසා, මිලදී ගත් භාණ්ඩ හා ඉතිරි භාණ්ඩ සම්බන්ධයෙන් තොග පාලනයක් හා එම භාණ්ඩවල පිරිවැයේ විශ්වාසනීයත්වය තහවුරු නොවුණි. | කර්මාන්ත ඉටුකිරීමේදි හා භාණ්ඩ මිලදී ගැනිමේදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කලයුතුවේ. | ප්‍රවර්තන වර්ෂයේදී කර්මාන්ත බොහොමයක් ඉටු කරන ලද්දේ සෘජු ශ්‍රමය උපයෝගී කරගනිමිනි. එහිදී ඉතා හදිසි හා අත්‍යවශ්‍ය සේ ප්‍රමුඛස්ථානය ලබා දෙමින් කඩිනමින් කාර්යයන් ඉටු කරන ලදී. එවන් හදිසි අත්‍යවශ්‍ය අවස්ථාවන් වලට පමණක් සීමාවෙමින්, නිලධාරින් විසින් අත්තිකාරම් ලබාගැනීම හැකිතාක් අඩු කිරිමට කටයුතු කර ඇත. අත්තිකාරම් භාවිතාකර පිටතින් ද්‍රව්‍ය තොග ලබා ගැනීමේදී අත්‍යවශ්‍ය වන අවම ප්‍රමාණයට පමණක් සිමා කරමින් ලබා ගන්නා බැවින් අතිරික්ත අමුද්‍රව්‍ය තොග ඉතිරි නොවේ. |

3.3 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට සභාවේ තථ්‍ය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 62ක් සහ අතිරික්ත 37 ක් පැවතුණි. | කාර්යමණ්ඩල වාර්තාව යාවත් කාලීන කර පුරප්පාඩු පුරවාගැනීමට කටයුතු කලයුතුවේ. | මෙම පුරප්පාඩු පුරවන පළාත් පාලන කොමසාරිස් (බ.ප)ගේ පළාත් පාලන ලේකම් (බ.ප) හා ප්‍රධාන ලේකම් (බ.ප) වෙත දන්වා යවා ඇත. එහෙත් මෙම පුරප්පාඩු සඳහා නිලධාරින් මෙතෙක් එවා නොමැති අතර කළමනාකරණ කටයුතු පහසු කර ගැනීම සඳහා ගණකාධිකාරි, නීති නිලධාරි හා පරිපාලන නිලධාරි තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත වර්ෂයක කාලයක් සඳහා බඳවා ගෙන ඇත |

(ආ) සේවක ණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය හා සේවය හැර ගිය සේවකයින් 122 දෙනෙකුගේ වසර 10කට වැඩි හිඟ රු.930,468ක් ද, වසර 05කට වැඩි හිඟ රු.359,115ක් හා වසර 05ට අඩු හිඟ රු.868,147ක් වශයෙන් එකතුව රු.2,157,730ක අයකර ගත නොහැකි සේවක ණය ශේෂයක් විය. | හිඟ සේවක ණය ශේෂ හඳුනාගෙන අදාල සේවකයන්ගෙන්, ඇපකරුවන්ගෙන් හා විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගතයුතුවේ. | ණය අයකර ගැනීම සඳහා අදාල ණය ලබා ගත් සේවක මහත්ම මහත්මීන් හට ලිපි හා නැවත සිහි කැඳවීමේ ලිපිද යවා ඇත. දීර්ඝ කාලයක සිට පැවත එන ණය ශේෂයන් පිළිබඳ තොරතුරු මේ වන විට සොයා බලන අතර ඉදිරියේ අය කර ගැනීමට කටයුතු කරමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ වාහන ඇණියේ ඇතුලත් වටිනාකම රු.5,900,000ක් වූ අබලි වාහන 05ක් අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි. | අබලි වාහන අපහරණය කිරීමට නොපමාව කටයුතු කළයුතුවේ. | මෙම වාහන වෙන්දේසිකර විකිණීමට කටයුතු කරමින් පවති. |

3.5 වත්කම් කළමනාකරණය

නිශ්ක්‍රිය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) වසර 15කට පමණ පෙර සභාවට අයත් අරුණෝදය මාවතේ පිහිටි ඉඩමක, ඉදිකර ඇති ප්‍රජාශාලා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණයකින් තොරව විනාශ වෙමින් පැවතුණි. | අදාල ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කලයුතුවේ. | මෙම ගොඩනැගිල්ල දැනට ඉතා අබලන් තත්වයක පවතින බැවින් නව ව්‍යාපෘති යෝජනාවක් සභාවට ඉදිරිපත් කිරීමේ අරමුණෙන් දැනට එහි වහලයේ උළු ඉවත් කර ඇත. |
| (ආ) 2016 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් පාසල් ළමුන් සඳහා බෙදා දීමට මිලදී ගෙන තිබුණු රු.192,746ක් වටිනා අභ්‍යාස පොත් 7135 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ දිරායමින් පැවතුණි. | අභ්‍යාස පොත් විනාශ වීමට පෙර බෙදා දීමට කටයුතු කලයුතුවේ. | 2018 වසර සඳහා පාසැල් ළමුන්ට පොත් බෙදාදීමේ වැඩසටහන සඳහා පොත් ඇණවුම් කිරිමේදි, 2016 වර්ෂයේ ඉතිරිව ඇති පොත් ප්‍රමාණයද ඇතුලත් කර ඉතිරි ප්‍රමාණයට පමණක් පොත් ඇණවුම් කරන ලදී. දැනට යම් ප්‍රමාණයක් පොත් ඉතිරිව ඇති අතර, එම පොත්ද අනිවාර්යෙන්ම 2019 වර්ෂය සඳහා පාසැල් ළමුන්ට පොත් බෙදා දීමේදි ප්‍රයෝජනයට ගන්නා බව සඳහන් කරමි. |

3.6 **හඳුනාගත් පාඩු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| (අ) **අංගම්පිටිය නිවාස සංකීර්ණය ඉදිකිරීම.** | | |
| සභාව විසින් 2015 වර්ෂයේදී රු.48,320,909 ක් වැයකර ඉදිකර තිබුණු දෙමහල් නිවාස සංකීර්ණය 2016 වර්ෂය වනවිට බිත්ති හා ස්ලැබ් තට්ටුව පුපුරා යමින් පවතින බව නේවාසිකයන් විසින් සභාවට දැනුම් දීමෙන් පසු නේවාසිකයන් එම ගොඩනැගිල්ලෙන් ඉවත්කර තාවකාලික ස්ථාන ලබා දී තිබුණි. | වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2015 වර්ෂයේ රජයේ අනුමත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් තෝරාගත් Electro Metal pressing (PVT) Ltd ආයතනය සමඟ වැට් රහිත රු. 40,823,485 මිලකට ගිවිසුම් ගත වී ඇත. නමුත් කරන ලද පස් පරික්ෂාවේදී සැලැස්මෙහි අත්තිවාරම ප්‍රමාණවත් නොවන බැවින් ගිවිසුම් ගත මුදලින් 20% අතිරේක මුදලක් මෙම කාර්ය ඉටු කිරිම සඳහා |

| | | |
|---|---|---|
| 2017 වර්ෂයේදී කළමනාකරණ කමිටු තීරණයක් මත නිවාස සංකීර්ණය ඉදිකිරීම සම්බන්ධව තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත භාරදී ඒ සඳහා රු.1,016,261 ක මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනවන විට උක්ත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුළු පිරිවැය රු.49,337,170 ක් දරා තිබුණි. ගිවිසුම් කඩ කිරීම හා වගකීමකින් තොරව කටයුතු කිරීම සම්බන්ධව කොන්ත්‍රාත්කරුට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | කොන්ත්‍රාත් ආයතනය වෙත ලබා දීමට සහා අනුමැතිය ලැබී ඇත. 2016.04.10 වන විට නගර සභාව වෙත භාර දී නිවැසියන් එහි පදිංචි කළ අතර 2016 අගෝස්තු වන විට නිවාස වල බිත්ති හා ස්ලැබ් තට්ටු පුපුරා යන ලදි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ලබා දෙන ලද වාර්තාවට හා සැලසුම් නිර්මාණයන්ට අනුව නව ආරක්ෂිත බැම්මක් ඉදි කිරීමට කටයුතු කරන ලදී. සිදු වූ පාඩුව සම්බන්ධයෙන් හා ගිවිසුම් කඩ කිරිම සම්බන්ධයෙන් එම කොන්ත්‍රාත් ආයතනයට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනිමට අපේක්ෂා කෙරේ. |
| (ආ) සභාවට අයත්ව තිබූ වෙළඳපල වටිනාකම රු.7,000,000 ක් වටිනා කැබ් රථයක් 2017 අගෝස්තු 15 දින සභාවේ භාරකාරිත්වයෙන් ඉවත්කර බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ නිල රථය ලෙස පරිහරණය කිරීමට භාරදී තිබූ අතර 2017 අගෝස්තු 17 දින ආණ්ඩුකාර ලේකම්වරයාගේ පෞද්ගලික නිවස පරිශ්‍රයේදී ගිනිගෙන විනාශ වී තිබුණි. ගිනි ගන්නා සුළු ඉන්ධන වර්ගයක් එකතු වීමෙන් රථය ගිනිගෙන ඇති බව අනාවරණය වී ඇතත් මේ සඳහා වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට සිදුවී ඇති පාඩුව අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුවේ. | මු.රෙ. 104(4) යටතේ සිදුකරන ලද පරීක්ෂණයේ අවසන් වාර්තාවට අනුව එකී රථය භාවිත නිලධාරී වන ආණ්ඩුකාර ලේකම් සහ රථයේ රියදුරු එස්.ඒ.ඩී.උමේෂ් දුනිෂ්ක යන අය ඉහත කී අනතුර සම්බන්ධයෙන් වගකිව යුතු බවට නිර්දේශය වී ඇති අතර එකී වාර්තාව ඉදිරි කටයුතු සඳහා 2019.01.14 දිනැතිව බස්නාහිර පළාත් පාලන කොමසාරිස් සහ ආණ්ඩුකාර ලේකම්ට යොමු කර ඇත. |

3.7 ප්‍රසම්පාදනය
----------------

3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම
------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර ගත යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

## 3.7.2 කොන්ත්‍රාත් පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) නුගේගොඩ ගංගොඩවිල සුභද්‍රාරාම අතුල රජමහා විහාරස්ථානයට අයත් ඉඩමක කියවීම් ශාලාව සමග සේවා පියස ඉදිකිරීම.<br><br>නුගේගොඩ ගංගොඩවිල සුභද්‍රාරාම අතුල රජමහා විහාරස්ථානයට අයත් පර්චස් 24.35 ක ඉඩමක කියවීම් ශාලාවක් සමග සේවා පියසක් ඉදිකිරීම සඳහා සභාව විසින් 2015 මාර්තු 15 සිට 2050 මාර්තු 14 දක්වා වසර 35 ක කාලයකට බදු පදනම මත ඉඩමක් ලබාගෙන තිබූ අතර ඒ වෙනුවෙන් 2015 අප්‍රේල් 15 දින රු.1,000,000 හා 2015 අප්‍රේල් 29 දින රු.680,000 ද වශයෙන් රු.1,680,000 ක් ගෙවා තිබුණි. මෙම ඉඩමේ ප්‍රජා මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.17,272,350කට 2015 අගෝස්තු 21 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණි. ඉඩමේ පස් පරීක්ෂාව, කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර සිදුකළ යුතු වුවත් සභාව විසින් ඉඩමේ පස් පරීක්ෂාව සිදුකර තිබුණේ කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසුව වන අතර ඒ සඳහා 2015 නොවැම්බර් 26 දින රු.273,615 ක් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවා තිබුණි. 2018 අගෝස්තු 27 දින වනවිට කොන්ත්‍රාත්කරු, ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබීම නිසා මේ වෙනුවෙන් වැයකරන ලද රු.1,953,615 ක මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | දිගු කාලීන බදු පදනම මත ලබාගත් දේපළ ප්‍රජාවට සේවාවන් සැලසෙන පරිදි යොදවා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුවේ. | මෙම ඉඩම වානිජ වටිනාකම අතින් ඉහල යන බැවින් අදාල බදු මුදල් ගෙවා නගර සභාව වෙත අයිතිය තහවුරුකර ගෙන ඇති අතර එම ස්ථානයේ බහු කාර්ය කටයුතු සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යෝජනා වි ඇත. |
| (ආ) ජයරජසිටි ව්‍යාපෘතිය<br><br>පිටකෝට්ටේ ජයරජ සිටි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා රු.619,276,616 ක කොන්ත්‍රාත් වටිනාකමකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු සමඟ 2016 පෙබරවාරි 15 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර 2017 අගෝස්තු 15 දින ව්‍යාපෘතිය නිම කළ යුතුව තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.27,867,447 ක ගාස්තුවක් යටතේ උපදේශක සමාගමක් සමග ගිවිසුම් ගතවී තිබුණු අතර ගොඩනැගිල්ල ඉදිකිරීමේදී එහි ව්‍යුහාත්මක සැලැස්මෙහි පැවති ප්‍රමාණාත්මක වූ දෝෂ හේතුවෙන් ගොඩනැගිල්ලේ පාදමෙහි හා බිම්වල ඉරිතැලීම් ඇතිවීම නිසා ඉදිකිරීම් තාවකාලිකව නතර කර තිබීමෙන් පසු 2018 සැප්තැම්බර් 10 දින වන විට කොන්ත්‍රාත්කරු වැඩබිම අත්හැර ගොස් තිබුණි. එම සැලසුම් අනුව ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යා නොහැකි තත්ත්වයක් මත කර්මාන්තය අතහැර දැමීමට 2019 පෙබරවාරි 14 දින මහා සභාව තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | සභාවට වැය වී ඇති මුළු වටිනාකම අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුවේ. | උපදේශන ආයතනය සමග ගිවිසුම් ගත වූ 2015 මාර්තු 10 දින සිට ව්‍යාපෘතිය ඉදි කිරීම ආරම්භ කල 2016.01.04 දින දක්වා වූ මාස 10 ක කාළය සඳහා ගිවිසුමෙහි පරිදි අදාළ මුදලින් 68% ක් ගෙවා ඇත. 2016.01.04 දින සිට ව්‍යුහාත්මක දෝෂ හේතුවෙන් ව්‍යාපෘතිය නතර කල 2017 මාර්තු දක්වා වූ මාස 14 ක කාලය සඳහා contract Administration stage යන අදියර සඳහා ගෙවීමට ඇති 30% ක ගාස්තුවෙන් 23% ක පමණ ප්‍රමාණයක් ගෙවා අවසන් කර ඇත. එවිට ගිවිසුමට අනුව ගාස්තුවෙන් 92% ක් පමණ ගෙවා ඇත. |

| | | |
|---|---|---|
| (i) ව්‍යුහාත්මක සැලැස්මේ දෝෂ හේතුවෙන් ව්‍යාපෘතිය අතරමග නැවතී තිබියදී ඊට අදාල උපදේශක සමාගමේ ගාස්තුවෙන් සියයට 95 ක් වූ රු.26,381,183 ක් ගෙවා තිබුණු අතර කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක් වූ අත්තිකාරම් මුදල සහ ඉදිරිපත් කර තිබුණු බිල්පත් 6 ක වටිනාකම ඇතුලත්ව රු.229,326,280 ක් වූ බදු සහිත මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | | |
| (ii) ව්‍යාපෘතිය අසාර්ථක විමට හේතු වූ උපදේශක ආයතනයට ගෙවන ලද රු.26,381,183 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණු අතර කොන්ත්‍රාත් සමාගමට ගෙවන ලද අත්තිකාරම් මුදල අයකර ගැනීමට, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු රු.30,963,831 ක්වූ කාර්යය සාධන ඇපකරය හා රු.90,506,309 ක් වූ අත්තිකාරම් ඇපකර 02ක් කල් ඉකුත්වීමට පෙර මුදල් කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | කාර්යය සාධන ඇපකරයේ වලංගු කාලය ඉකුත් වීමට පෙර අදාල කටයුතු නොකිරීමට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | කාර්ය සාධන ඇපකරය හා අත්තිකාරම් ඇපකර දෙකෙහි කාලය දීර්ඝ කරන ලෙස අවස්ථා දෙකකදිම ලිඛිතව බැංකුව වෙත දැනුම් දීම් සිදු කර ඇත. |
| (iii) මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම් නිමවන තෙක් එහි පැරණි ගොඩනැගිල්ලෙහි සිටි කඩහිමියන් පදිංචි කරවීමට 2018 වර්ෂ වෙනුවෙන් රු.6,780,000 ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ගෙවා තිබුණි. | සභාවට වැයවන අතිරේක වියදම් සම්බන්ධයෙන් නිලධාරීන් වගකීමෙන් කටයුතු කළ යුතුවේ. | 2017 වර්ෂයේදී ව්‍යාපෘතිය නිම කල යුතු වුවත් ව්‍යුහාත්මක දෝශ නිසා සිදු වූ ප්‍රමාදය හේතුවෙන් කඩහිමියන් සඳහා ලබා දීමට වෙනත් ස්ථානයක් නොතිබීම නිසා 2018 වර්ෂය සඳහා ද කඩහිමියන් පදිංචි කිරිම වෙනුවෙන් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට ගෙවීම් සිදු කර ඇත. |
| (ඇ) මොරගස්මුල්ල 4 වන පටුමග සායන ගොඩනැගිල්ල පැවති භූමියේ නිවාස ඒකක 18කින් සමන්විත සිව් මහල් නිවාස සංකීර්ණයක් ඉදිකිරීම.<br>-----------------------------------------------------------------<br>මොරගස්මුල්ල 4 වන පටුමගෙහි පැවති පැරණි ගොඩනැගිල්ල සහ එහි පවත්වාගෙන ගිය දන්ත සායනය, කාය වර්ධන මධ්‍යස්ථානය සහ පුස්තකාලය කඩා ඉවත් කර එම ස්ථානයෙහි නිවාස ඒකක 18 කින් සමන්විත සිව්මහල් නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට තීරණය කර තිබුණු අතර මාස 6ක කාලයකදී ඉදිකර භාරදීමට රු.69,704,581ක කොන්ත්‍රාත් වටිනාකමකට පෞද්ගලික ආයතනයකට 2016 ජුනි 01 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය. | ගොඩනැගිලිවලින් ඉවත් කරන භාණ්ඩ ලේඛණ ගතකර ගබඩාවට භාර දී ප්‍රයෝජනයට ගැනීම හෝ ඉවත් කිරීම කළ යුතු අතර ඒ පිළිබඳ ලේඛණ නඩත්තු කළ යුතුවේ. | පැරණි ගොඩනැගිල්ල ඉතාමත් අබලන් තත්ත්වයේ පැවතීම නිසා භාවිතා නොකර අතහැර දමා තිබුණි. එහි තිබූ භාවිතයට ගත හැකි භාණ්ඩ නගර සභාව විසින් සිදු කල ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා යොදා ගත් අතර වේයන් ආදි කෘමි සතුන් විසින් විනාශ කර දිරාපත් වී භාවිතයට ගත නොහැකි තත්ත්වයේ තිබුණු භාණ්ඩ විනාශ කරන ලදී. |

| | | |
|---|---|---|
| (i) පැරණි ගොඩනැගිල්ලෙන් ඉවත් කරන ලද ලී දඬු, උළුවහු පරාල හා අනෙකුත් වටිනා උපාංග බැහැර කළ ආකාරය හෝ ප්‍රයෝජනයට ගත් ආකාරය සම්බන්ධව සාක්ෂි නොතිබුණි. | | |
| (ii) සභාව විසින් කොන්ත්‍රාත්කරු වෙත රු.25,511,312 ක් ගෙවා තිබූ අතර 2017 අගෝස්තු මස 15 දින ජනතා අයිතියට පත්කළ බවට එලකයන් තිබුණද, කිසිම පුද්ගලයකු එහි වාසය නොකරන බව, ගොඩනැගිල්ලේ වැඩ කටයුතු නිමකර නොමැති බව, ජලය, විදුලිය ආදී අත්‍යාවශ්‍ය මූලික පහසුකම් සකස් කර නොමැති බව, කොන්ත්‍රාත්කරු එම කර්මාන්තය අතහැර ගොස් ඇති බව හා පරිශ්‍රය අවට වල් බිහිවී තිබූ බව 2018 සැප්තැම්බර් මස සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. | සභාවේ මෙහෙයුම් කටයුතු නිසි ක්‍රමවේදයක් අනුව සිදුවිය යුතුවේ. | 2017 අගෝස්තු මස 15 වන විට නිවාස අයිතිකරුවන්ට භාර දුන් නමුත් ගොඩනැගිල්ලෙහි ඉතිරි වැඩ අවසන් නොවීම හේතුවෙන් නිවැසියන් එහි පදිංචි වී නොවීම නිසා සභාවෙහි සෘජු ශ්‍රමය යොදා ව්‍යාපෘතියෙහි වැඩ අවසන් කර නිවැසියන් පදිංචි කරවීමට කටයුතු යොදනු ලැබේ. |
| (ඇ) නානායක්කාර මාවතේ නගර සභා වැඩ ඒකකය,වාහන නඩත්තු ඒකකය සහ ගබඩා සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම.<br>------------------------------------------------------------------------<br>සභාව විසින් නගර සභා වැඩ ඒකකය,වාහන නඩත්තු ඒකකය සහ ගබඩා සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.46,973,098ක කොන්ත්‍රාත් වටිනාකමකට පෞද්ගලික ආයතනයක් සමග 2014 අගෝස්තු 27 දින ගිවිසුම්ගත වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7: 10 (අ) ප්‍රකාරව ලංසුකරුගේ පශ්චාත් සුදුසුකම් පරීක්ෂණය හා කොන්ත්‍රාත්තුව ඵලදායී ලෙස ඉටුකිරීමේ ඇති හැකියාව හා සම්පත් ඇති බවට සභාව විසින් ඇගයීමක් කළ බවට සාක්ෂි නොවීය | ලංසු ඇගයීමේදී අවම මිලට අමතරව ඔවුන්ගේ මේ හා සමාන කර්මාන්ත ඉටුකිරීමේ පලපුරුද්ද හා මූල්‍යම හැකියාව ද සලකා බැලිය යුතුවේ. | ලංසුකරුවන් ඉදිරිපත් කර තිබූ මිළ ගණන්, පලපුරුද්ද හා හැකියාව සම්බන්ධ ඇගයීම් කිරීම සඳහා ඇගයීම් කමිටුවක් පත් කල අතර ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්, නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂක, නාගරික ගණකාධිකාරී, නාගරික ඉංජිනේරු හා තාක්ෂණ නිලධාරීන් ගෙන් යුත් කමිටුවක් විසින් අදාල සුදුසුකම් මත ඇගයීම් කර ටෙන්ඩර්කරුවකු තෝරාගෙන ඇති අතර ඇගයීම් කමිටු වාර්තාව සඳහා මහා සභා අනුමැතිය ලැබී ඇත. |
| (ii) කොන්ත්‍රාත්කරු විසින් 2014 අගෝස්තු 11 දින උකුවෙල සණස බැංකුවෙන් නිකුත්කර තිබුණු රු.2,348,653 ක කාර්ය සාධන ඇපකරය සභාව පිළිගෙන තිබුණද එම බැංකුව ශ්‍රී ලංකා මහා බැංකුවේ අනුමත බැංකුවක් නොවීය. | ගිවිසුම් සඳහා පිළිගත් බැංකුවලින් පමණක් ඇප කර ලබාගැනීම කලයුතුවේ. | කාර්ය සාධනයේ ඇපකරය ලබා ගත් බැංකුව ශ්‍රී ලංකා මහා බැංකුවේ අනුමත බැංකුවක් නොවුවත් ISO 9001-2000 certificate අංක QSC 0281 යටතේ ලියාපදිංචි බැංකුවකි. |

| | | |
|---|---|---|
| (iii) අත්තිවාරම් ඉදිකිරීම් මට්ටමේදී ගොඩනැගිලි සැලැස්මෙහි ඇතුලත් නොවූ වැඩ සඳහා ඇස්තමේන්තු පිරිවැය ඉක්මවා රු.2,576,329 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.<br><br>(iv) 2015 පෙබරවාරි 12 දින වනවිට කොන්ත්‍රාත්කරුට සියයට 20 ක අත්තිකාරම හා එදිනට කළ වැඩ ප්‍රමාණය වෙනුවෙන් රු.17,651,987 ක් ගෙවා තිබියදී වැඩබිම අතහැර ගොස් තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් සභාවට ඉදිරිපත් කර තිබුණු වටිනාකම රු.11,743,270ක බැංකු ඇපකර 2ක් කල්පිරීමට ඉදිරියට මාස 4ක කාලයක් තිබුණද එය මුදල් කර ගැනීමට සභාව පියවර ගෙන නොතිබුණි. මේ අනුව මෙම කර්මාන්තය සඳහා වැයකර තිබුණු රු.17,651,987 ක මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. එදිනට සභාව විසින් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබූ වටිනාකම රු.6,183,416ක් විය | ව්‍යාපෘති සැලසුම් කිරීමේදි භූමියේ පස් පරීක්ෂාව, ගොඩනැගිල්ලේ පාදමෙහි ප්‍රමාණය නිසිලෙස සැලසුම් නොකිරීම හා බැංකු සුරක්ෂණ කල්පසු වීමට පෙර මුදල් කරගෙන සභාවට සිදුවන පාඩුව අවමකරගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කල යුතුවේ. | කර්මාන්තය සිදුකර ගෙන යන අතරතුර බාහිර පාර්ශව විසින් ඉදිකිරීම් වලට විරෝධය පා කොන්ත්‍රාත්කරුට හා වැඩ කරන අයට තර්ජන සිදු කර ඇති බැවින් පොලිසියට පැමිණිලි කිරීමෙන් අනතුරුව තාවකාලිකව වැඩ නවතා ඇත. මුල් ගොඩනැගිල්ල වෙනුවට ගෘහස්ථ ක්‍රීඩාගාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. |
| (ඉ) වැලිකඩ පොලීසිය අසල ඉඩමේ නව නගර සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම<br>-----------------------------------------------------------------------<br>වැලිකඩ පොලීසිය අසල පිහිටි සභාවට අයත් ඉඩමක නව නගර සභා කාර්යාල ගොඩනැගිල්ල අළුතින් ඉදිකිරීමට අදාල ගෘහ නිර්මාණ කටයුතු සඳහා රු.36,010,657ක ගාස්තුවක් යටතේ උපදේශක සමාගමක් සමග 2015 ජනවාරි 26 දින ගිවිසුම් ගතවී රු.22,220,340 ක් ගෙවා තිබුණි. 2015 මැයි 07 දිනැති සභා තීරණයක් මත ඉහත ඉදිකිරීම දැනට පවතින සභා පරිශ්‍රයෙහි ඉදිකිරීම සඳහා උපදේශක සමාගම සමග ගිවිසුම්ගත වී තිබුණු අතර ඒ වෙනුවෙන් රු.4,000,000ක් ගෙවා තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින වනවිටත් ඉදිකිරීම් ආරම්භකර නොතිබුණි. සභාවෙන් අයවිය යුතු රු.15,138,788 ක් අයකර ගැනීම සඳහා උපදේශක සමාගම විසින් සභාවට එරෙහිව බේරුම්කරණ නඩුවක් පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් නඩු ගාස්තු ලෙස රු.259,000 ක් වැයකර තිබුණි. එම නිසා මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් වැයකර තිබුණු රු.26,479,340 ක මුදල ආර්ථික හා ඵලදායී බවින් තොර වියදමක් බවට පත්ව තිබුණි. | මහා පරිමාන කර්මාන්තයක් ඉදිකිරීමට ප්‍රථම ස්ථානය නිශ්චිත කරගත යුතු අතර ඒ සඳහා දැරීමට සිදුවන වියදම් ඇස්තමේන්තු සකස්කළ යුතුය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළයුතුවේ. | යෝජිත නව නගර සභා කාර්යාලය පොලීසිය අසල ඉඩම තුලම ඉදි කිරීමට තීරණය කර තිබූ නමුත් සැහැල්ලු දුම්රිය මාර්ගය හා රාජගිරිය ගුවන් පාලම මෙම ඉඩම අසලින් යාමට සැලසුම් කර තිබීම නිසා මෙම ඉඩමේ වාණිජ වටිනාකම වැඩිවීම යන කරුණු සැලකිල්ලට ගනිමින් නගර සභාව දැනට පවතින භූමිය තුළම නව නගර සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමට 2015.05.07 දින මහා සභාව විසින් තීරණය කරන ලදි. ඉඩමේ වෙනස්වීම සැලකිල්ලට ගෙන සුදුසු පරිදි වෙනස් කිරීම පමණක් කරමින් නව සැලසුම සකස් කරන ලෙස උපදේශන සමාගමට<br><br>උපදෙස් දෙන ලදි. උපදේශන ගාස්තුවෙන් එයින් 0.51% ක පමණ වැඩ අවසන් කල පසු උපදේශන ගාස්තුව ලෙස ලක්ෂ 40 ක මුදලක් |

| | | |
|---|---|---|
| | | ගෙවා ඇත. ඉතිරි ගෙවීම් නොකිරීම හේතුවෙන් එම ආයතනය බේරුම්කරණයේ නඩුවක් පවරා තිබේ. |
| (ඊ) ජනජයසිටි ව්‍යාපෘතිය<br>----------------------------<br>සභාව විසින් රු.1,687,986,224 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2014 අගෝස්තු 01 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමග ගිවිසුම්ගත වී 2018 දෙසැම්බර් 31 දිනට රු.1,801,168,022 ක් ගෙවා තිබුණු අතර එම ගෙවීම තුල ඇතුලත් වූ රු.113,181,798 ක් වූ අසම්භාවයන් හා අමතර වැඩ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ප්‍රකාරව 2018 ඔක්තෝබර් 12 දිනවන විටත් කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය අවසන්කර, අවසන් කිරීමේ සහතිකයක් සභාවට භාරදී නොතිබුණි. එසේ වුවද සභාව විසින් ගොඩනැගිල්ලේ අඩුපාඩු තිබියදීත් එහි කඩ කාමරවල යතුරු 2018 ඔක්තෝබර් 12 දින කඩහිමියන් වෙත භාරදී තිබුණි. | ව්‍යාපෘතිය නිම කිරීම් සහතිකයක් කොන්ත්‍රාත්කරු ගෙන් ලබාගත යුතුවේ. | 2018 ජුනි මස 30 වන දින නවලෝක කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගම විසින් වැඩ අවසන් කරන ලද ජනජයසිටි සුපිරි වෙළඳ සංකීර්ණයෙහි එක් එක් මහල් සඳහා වෙන වෙනම යතුරු මෙම සභාව වෙත භාර දී ඇත. ඒ අනුව ඒ ඒ මහල් සඳහා 2018.10.12 වන දින සිට අදාළ කඩහිමියන් වෙත යතුරු ලබා දී ඇත.<br>මෙම සභාව විසින් ජනජය සිටි ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම ලෙස රු.1,687,986,244 මුදලකට 2014.08.01 වන දින නවලෝක ආයතනය සමග ගිවිසුම් ගත වී ඇත. ඉන් පසු වැය වූ අසම්භාව්‍යන් හා අමතර වැඩ සම්බන්ධයෙන් 2019.02.07 වන දින භෞතික සැලසුම් කර්මාන්ත හා ප්‍රවාහන කටයුතු පිලිබඳ අංක 62.29 දරන නිර්දේශය හා 2019.02.14 දින මහා සභා රැස්වීමේ අංක 06.01 යටතේ රු. 281,905,884 ක මුදලක් සඳහා අනුමැතිය ලැබී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

3.6.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වටිනාකම රු.442,459,154 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණයක් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතුවේ. | දැනට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණය සිදු කරමින් පවතී. ආදාල සමීක්ෂණ වාර්තාව ඉදිරි ස්ථාවර කමිටු හා මහා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

4.1 නොවිසදී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

පිළිතුරු නොලත් විගණන විමසුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී නිකුත්කල එකතු වටිනාකම රු.229,326,280ක් වූ විගණන විමසුමක් සඳහා පිළිතුරු සපයා නොතිබුණි. | විගණන විමසුම් සදහා නොපමාව පිළිතුරු ලබාදිය යුතුවේ. | ඉහත විගණන විමසුම සඳහා කඩිනමින් ඔබ වෙත පිළිතුරු ඉදිරිපත් කරමි. |